# පණ්ඩුකාභය කාගේ කවුද?

(මෙම ලේඛකයා විසින් ප්‍රකාශිත "විදේශීය ආක්‍රමණ හා ලංකාවේ විමුක්ති සටන්" නමැති කෘතියෙන් උපුටා ගැනිනි.)

- ඒ.එම්. කරුණාරත්න -

පණ්ඩුකාභය පිළිබඳව අසිරිමත් කතාවක් නිර්මාණය කර ඇති මහවංශ කර්තෘ මහානාම හිමියන් තම කෘතියේ පරිච්ඡේද දෙකක් ඒ සඳහා වැය කර ඇත. ඒ පරිච්ඡේද දෙක පුරා කියැවෙන පණ්ඩුකාභයගේ ජීවන කතාව ඉතිහාස කතාවට වඩා සමීප වන්නේ සුරංගනා කතාවකට ය. මේ නිසා පණ්ඩුකාභය පිළිබඳ සත්‍ය කතාව ඒ සැරසිලිවලටම යටවී ගීන වී ගොස් ඇති බව පෙනේ. මහාවංශය රචනා කළ මහානාම හිමියන් එය රචනා කළේ ක්‍රි. ව. 5 වන සියවසේ බව පිළිගත් මතයකි. ගයිගර්ගේ කාලනිර්ණය අනුව ගත් කල එය ලියා ඇත්තේ පණ්ඩුකාභයගේ රාජ්‍ය කාලයෙන් වසර 900 කට පමණ පසුව ය. පණ්ඩුකාභය ගැන විස්තර සඳහන් අනෙක් මූලාශ්‍ර ඊටත් පසුව ලියූ ඒවා ය. එබැවින් ඒ යුගය පිළිබඳ කිසියම් නිගමනයක් කිරීමේ දී ඒ මූලාශ්‍රවල ඇති කරුණු මැනවින් තෝරා බේරාගෙන අවධානයට ගත යුතු ව ඇත.

පණ්ඩුකාභය පිළිබඳව ලියැවී ඇති පැරණි මූලාශ්‍ර මෙන් ම පසුකාලීන ලංකා ඉතිහාසය පිළිබඳව ගවේෂණාත්මක කරුණු ඉදිරිපත් කළ ග්‍රන්ථ ද පණ්ඩුකාභය පිළිබඳව ඉදිරිපත් කරන කරුණුවල ඇති පරස්පරතා ගැන මේ බොහෝ ග්‍රන්ථ වල අවධානයක් යොමු කර ඇති බවක් නොපෙනේ.